සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

10 ශ්‍රේණිය

# නාට්‍ය හා රංගකලාව - I

කාලය පැය 03 යි
අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

---

- පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය කොටස් ඇසුරෙන් 1 සිට 5 දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - මද පවන හමා
සීපාවෝ පවා තොස් වේ මේ
රන් වන් සිහින් දිය ඇල්ලන් ගලායයි
ගල් මුල් ඉවත පිසදා

B - හෙළ ගැඹුරුයි
පුත නොබලන්
සෙලවෙන කොට වැල් පාළම
දෑස පියන් බිම නොබලන්

C - දී කිරි දී කිරි
ගෙනාවා දී කිරි
මිහිපිට කාටත්
ගුණ දෙන දී කිරි

D - පැදුර වියන්න කොහේද යන්නේ,
(මිනිහා කතාවක් නැතුව හිදී)
ඉර සඳ පායන විලට යමු

E - ජටා හිස දරමින - ශුද්ධ අෂ්ටක වැල්ද කරලන
කුඩය ගෙන සුරතින - මෙසේ බමුණෙක් සබේ නික්මුණ

01. හෙන්රි ජයසේනයන්ගේ නාට්‍යයක් හා සම්බන්ධ අක්ෂරය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

02. ගර්භාරක්ෂක ශාන්තිකර්මයට අදාළ අක්ෂරය වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

03. උම්මග්ග ජාතකය ඇසුරෙන් නිර්මාණය වූ වේදිකා නාට්‍යයකට අදාළ අක්ෂරය වන්නේ,
(1) C ය. (2) D ය. (3) E ය. (4) A ය.

04. රතු හැට්ටකාරී නාට්‍යයට අදාළ අක්ෂරය වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

05. මැණික්පාල බිසව හා සම්බන්ධ ශාන්තිකර්මයට අදාළ අක්ෂරය වන්නේ,
(1) E ය. (2) D ය. (3) C ය. (4) B ය.

- **ප්‍රශ්න අංක 6 සිට 15 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන නිවැරදි පිළිතුර තෝරන්න.**

06. නාට්‍යයකට අවශ්‍යම අංගත්‍රය වන්නේ,

    1) නාට්‍ය පෙළ, නළුවා, ප්‍රේක්ෂකයා ය. (2) නාට්‍ය පෙළ, නළුවා, අධ්‍යක්ෂකවරයා ය.

    (3) අධ්‍යක්ෂකවරයා, නළුවා, ප්‍රේක්ෂකයා ය. (4) නළුවා, අධ්‍යක්ෂකවරයා, ආනුෂංගික ශිල්පීන් ය.

07. අභිරූපණ රංගනයකදී වඩාත් ප්‍රයෝජනවත් වන්නේ,

    (1) සතර අභිනය ය. (2) රංග භාණ්ඩ ය.

    (3) ඇඳුම් පැළඳුම් ය. (4) ශාරීරික ප්‍රකාශන ය.

08. දෑස් අතර සබඳතාවය නොගිලිහි පවත්වා ගැනීම සඳහා සිදු කරනු ලබන අභ්‍යාසයක් වන්නේ,

    (1) ශිථිලීකරණ අභ්‍යාසය යි. (2) දර්පණතල අභ්‍යාසය යි.

    (3) පරිකල්පන අභ්‍යාසය යි. (4) තාපන අභ්‍යාසය යි.

09. රංග ක්‍රීඩා පමණක් ඇති වරණය තෝරන්න.

    (1) මීයෝ මීමෝ, ගස් දෙකේ යුද්ධය, වෙද පුටුව

    (2) මතක බන්දේසිය, මකර වල්ගය කැඩීම, මෝරා සහ දූපත්

    (3) මීයෝ මීමෝ, ආඩු වීඩු, ගස් කොඩි

    (4) ගස් දෙකේ යුද්ධය, මීයෝ මීමෝ, හිම කන්ද දිය වීම

10. මෙහි දෘශ්‍ය කලා පමණක් සඳහන් වන වරණය වන්නේ,

    (1) සංගීතය, චිත්‍ර, නර්තනය, චිත්‍රපටි ය. (2) ටෙලි නාට්‍ය, නාට්‍ය, මුද්‍රා, බැලේ ය.

    (3) චිත්‍ර, මූර්ති, කැටයම්, ලියවැල් මෝස්තර ය. (4) ඔපෙරා, ගීත නාට්‍ය, මුද්‍රා නාට්‍ය, කාටූන් ය.

11. ''අවස්ථාවන් අනුකරණය කිරීම නාට්‍යයකි'' යනුවෙන් ප්‍රකාශ කරන ලද්දේ,

    (1) ධනංජය පඬිවරයා ය. (2) භරත මුණිවරයා ය.

    (3) ඇරිස්ටෝටල් ය. (4) විශ්වනාත් පඬිවරයා ය.

12. නාට්‍ය කලාවේ මූලික අරමුණක් වන්නේ,

    (1) නරඹන්නාට උපදේශයක් ලබා දීමයි. (2) නරඹන්නාට ආදර්ශ ලබා දීමයි.

    (3) නරඹන්නාට රසවින්දනයක් ලබා දීමයි. (4) නරඹන්නාට ජීවිතාවබෝධයක් ලබා දීමයි.

13. නාට්‍ය කලාවේ මූලාරම්භය හා වඩාත් සම්බන්ධ වන්නේ,

    (1) අභිචාර විධීන්ය. (2) සංස්කෘතිකාංගයන් ය. (3) බෞද්ධ පූජාකර්මයන් ය. (4) ශාන්තිකර්මයන් ය.

14. නාට්‍යයක් රඟ දක්වන මොහොතේ එහි සාර්ථකත්වය උදෙසා සිටිය යුතු අත්‍යාවශ්‍යම පුද්ගලයා වන්නේ,

    (1) නළුවා ය. (2) අධ්‍යක්ෂකවරයා ය. (3) වේෂ භූෂණ ශිල්පියා ය. (4) ප්‍රේක්ෂකයා ය.

15. නාට්‍යයක් හා කතන්දරයක් අතර ඇති සමානතාවයක් දැක්වෙන වරණය වන්නේ,

    (1) නාට්‍යොචිත අවස්ථා ඇත. (2) සංවාද දක්නට ලැබේ.

    (3) චරිත දක්නට ලැබේ. (4) මුල මැද අග අනුපිළිවෙලින් ඇත.

- **පහත ඡායාරූප ඇසුරෙන් 16 - 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| ක | ග | ජ | ට | ඩ |
|---|---|---|---|---|
|  |  |  |  |  |

16. මෙහි ලෝකධර්මී නාට්‍ය කලාවේ පියා ලෙස හැඳින්වෙන නාට්‍යකරුවා දැක්වෙන වරණය වෙන්නේ,

(1) ''ක'' ය. (2) ''ග' ය. (3) '' ජ'' ය. (4) ''ඩ '' ය.

17. ''ජන කරළිය'' රඟමඬල ආරම්භ කළ නාට්‍යකරුවා දැක්වෙන වරණය වෙන්නේ,

(1) ''ඩ'' ය. (2) ''ට'' ය. (3) ''ක'' ය. (4) ''ග '' ය.

18. ඉංග්‍රීසි නාට්‍ය කලාව හා සම්බන්ධ නාට්‍ය කරුවා දැක්වෙන වරණය වෙන්නේ,

(1) ''ග'' ය. (2) ''ජ' ය. (3) '' ට'' ය. (4) ''ඩ '' ය.

19. ''මෙතනින් මාරුවෙනු'' නාට්‍යයට රංගනයෙන් දායක වූ නිරූපණ ශිල්පියා දැක්වෙන වරණය වෙන්නේ,

(1) ''ජ'' ය. (2) ''ට' ය. (3) '' ඩ'' ය. (4) ''ක '' ය.

20. ගුවන් විදුලි නාට්‍ය හා සම්බන්ධ නිරූපන ශිල්පියා දැක්වෙන වරණය වෙන්නේ,

(1) ''ග'' ය. (2) ''ජ' ය. (3) '' ඩ'' ය. (4) 'ක '' ය.

- **පහත වගුව ඇසුරින් 21 - 25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| ක | ග | ජ | ට | ඩ |
|---|---|---|---|---|
| අඹ විදමන | පාලි දොළහ | තල්පත | නානුමුරය | වඩිග පටුන |
| වෙල්ලි අම්බලම | සළුව | දේව දූතයා | කැඩපත | කළු කුඩය |
| රාමා මැරීම | කෙන්ඩිය | යුගාසනය | පනාව | තලප්පාව |

21. රට යකුම ශාන්තිකර්මයට අයත් වන්නේ,

(1) ''ක'' ය (2) ''ග' ය (3) '' ජ'' ය (4) 'ට '' ය

22. සන්නි යකුම ශාන්ති කර්මයට අයත් වන්නේ,

(1) ''ග'' ය. (2) ''ජ' ය. (3) '' ට'' ය. (4) 'ඩ '' ය.

23. සූනියම් යාගය ශාන්තිකර්මයට අයත් වන්නේ,

(1) ''ජ'' ය. (2) ''ට' ය. (3) '' ඩ'' ය. (4) 'ක '' ය.

24. බෞද්ධ පූජාකර්මවලට අයත් වන්නේ,

(1) ''ට'' ය. (2) ''ජ' ය. (3) '' ග'' ය. (4) 'ඩ '' ය.

25. මඩු ශාන්තිකර්මයට අයත් වන්නේ,

(1) ''ඩ'' ය. (2) ''න' ය. (3) '' ක' ය. (4) 'ග '' ය.

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

26. නිර්මිත චලනයක් වන්නේ,

(1) උඩ පැනීමයි. (2) ඇවිදීමයි. (3) නොන්ඩි ගැසීමයි. (4) දිවීමයි.

27. ''රූපණ විධි ක්‍රමය'' නම් ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

(1) ඇලඩයිස් නිකොල් විසිනි. (2) ස්ටැනිස් ලාව්ස්කි විසිනි.

(3) භරත මුණි විසිනි. (4) ඇරිස්ටෝටල් විසිනි.

- **නොගැලපෙන පිළිතුර තෝරන්න.**

28. නාට්‍යයම අවස්ථාවක් තුළ අත්‍යවශ්‍යයෙන් තිබිය යුතු ගුණාංගයකි,

(1) කුතුහලය. (2) එකඟතාවක්. (3) දෙපාර්ශවයක්. (4) අවිනිශ්චිත බවක්.

29. රංග අභ්‍යාසයකින් ලැබෙන ප්‍රයෝජනයක් වන්නේ,

(1) මානසික සැහැල්ලුවක් ලැබීම ය. (2) අභිනය භාවිතයට හුරුවීම ය.

(3) ආනුෂංගික කලා පිළිබඳ අවබෝධය ලැබීම ය. (4) අනුකරණයට හුරුවීම ය.

30. සංවේදන අභ්‍යාසයකදී යොදා ගන්නේ,

(1) ඇස යි. (2) මනස යි. (3) කන යි. (4) නාසය යි.

31. නාට්‍යයක පිටපතක් හා සම්බන්ධ වන්නේ,

(1) වේෂ භූෂණ (2) රංග විධාන (3) සංවාද (4) නාට්‍යෝචිත අවස්ථා

- **පහත රූප ඇසුරෙන් අංක 32 - 34 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A  B 

32. ඉහත A රූපයෙන් දැක්වෙන්නේ,

(1) දේව සන්නිය යි. (2) මුර්තු සන්නිය යි. (3) දෙමළ සන්නිය යි. (4) අභූත සන්නිය යි.

33. ඉහත B රූපයෙන් දැක්වෙන්නේ,

(1) පිස්සු සන්නිය යි. (2) කණ සන්නිය යි. (3) වාත සන්නිය යි. (4) අමුක්කු සන්නිය යි.

34. මෙම මුහුණු වලට අදාළ ශාන්ති කර්මය වන්නේ,

(1) දෙවොල්මඩුව යි. (2) රට යකුම යි. (3) සූනියම් යාගය යි. (4) දහ අට සන්නිය යි.

- **35 - 40 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.**

35. නාට්‍ය සංගීතය අදාළ වන අභිනය වන්නේ,

(1) ආංගිකාභිනය (2) සාත්විකාභිනය (3) ආහර්ය අභිනය (4) වාචිකාභිනය

36. දික්තල කාලගෝල නාට්‍යය අවසන් වන්නේ,

(1) පොතේ ගුරු පූර්ණ විරිදුවෙනි. (2) මංගලම් සිංදුවෙනි.

(3) තෝඩායම් ගායනයෙනි. (4) සර්ගයෙනි.

37. සමාරෝපය යන්නට වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) මුහුණේ අංගෝපාංගයන් මගින් අදහස් ප්‍රකාශනයයි.

(2) චරිතයට අදාළ වචන කතා කිරීමයි.

(3) පරිකල්පනයෙන් මවා ගන්නා චරිත නිරූපණය කිරීමයි.

(4) තමා වෙනුවට වෙන අයෙකු නිරූපණය කිරීමයි.

38. භූමිකාවක් යනු

(1) චරිතයක පැතිකඩ වේ. (2) චරිතය වේ.

(3) නාට්‍යයක සියලු චරිත වේ. (4) පිටපතක අවශ්‍ය චරිත වේ.

39. නාට්‍ය කලාව හා සම්බන්ධ පර්යේෂණාත්මක කෘතියක් වන්නේ,

(1) අපිට පුතේ මගක් නැතේ ය. (2) පිං ඇති සරසවි වරමක් දෙන්නේ ය.

(3) රූපණය ය. (4) ගැමි නාටකය ය.

40. ''නාට්‍ය ශාස්ත්‍රය'' කෘතිය රචනා කරන ලද්දේ,

(1) ස්ටැන්ස් ලාවිස්කි විසිනි. (2) ඇරිස්ටෝටල් විසිනි.

(3) ධනංජය පඬිතුමා විසිනි. (4) භරතමුණි පඬිවරයා විසිනි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

10 ශ්‍රේණිය

# නාට්‍ය හා රංගකලාව - II

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01 දික්තල කාලගෝල නාට්‍යය ඇසුරින් පිළිතුරු සපයන්න.

(i) දික්තල කාලගෝල නාට්‍යයට පාදක වූ ජාතක කථාව නම් කරන්න. (ලකුණු 02)

(ii) මෙම නාට්‍යයේ රංග ශෛලිය හා සම්ප්‍රදාය නම් කරන්න. (ලකුණු 02)

(iii) මෙහි එන චරිත 2 ක් නම් කරන්න. (ලකුණු 02)

(iv) මෙම නාට්‍යයේ ඔබ කැමති ගීතයක කොටසක් ලියන්න. (ලකුණු 02)

(v) මෙම නාට්‍යය පළමු වරට වේදිකාගත වූයේ කුමන වර්ෂයේ ද? (ලකුණු 02)

(vi) මෙම නාට්‍යයේ වර්තමාන නිෂ්පාදකවරයා කවු ද? (ලකුණු 02)

(02) (i) නෘත්ත යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) නෘත්ත හා නෘත්‍යයේ සමාන අසමාන කම් 2 බැගින් ලියන්න. (ලකුණු 04)

(iii) නෘත හා නෘත්‍යයෙන් නාට්‍යය වෙනස් වන ආකාරය ලියන්න. (ලකුණු 06)

(03) (i) ප්‍රාසංගික කලාව යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) ප්‍රාසංගික කලාවන් 4 ක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ප්‍රාසංගික හා ප්‍රාසාංගික නොවන කලාවක් අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) ක්ෂණික නිරූපණය යනු නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) ක්ෂණික නිරූපණ කිරීමෙන් නළුවෙකුට ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) ඔබ සිදුකරන ලද රංග ක්‍රීඩාවක් විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) පහතරට ශාන්තිකර්ම 2 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) එක් ශාන්තිකර්මයක උපත් කතාව ලියන්න. (ලකුණු 04)

(iii) ඉහත නම් කරන ලද එක් ශාන්ති කර්මයක නාට්‍යමය අවස්ථාවක් නම් කර එහි ප්‍රාසාංගික ලක්ෂණ පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (i) රූපණය යනු කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) රූපණ ශිල්පියා සතු ගුණාංග හා ශක්‍යතා 2 බැගින් ලියන්න. (ලකුණු 04)

(iii) රූපණයේදී සතර අභිනය භාවිතය විශේෂ වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) පහත දැක්වෙන කතා සැකිල්ල ඔබ කැමති පරිදි අවසානයක් කරා ගෙනයමින් නාට්‍ය පෙළක් රචනා කරන්න. මෙහිදී ඔබට අවශ්‍ය පරිදි චරිත සංඛ්‍යාව අඩු වැඩි කරගත හැකිය.

නිතරම සතුටින් සිටීමට කැමති චතුර පන්ති කාමරයේදී, ඉගෙනුම් ක්‍රියාවලියේදී, විෂය බාහිර ක්‍රියාකාරකම් වලදී කිසිදු යහළුවෙක්, යෙහෙළියක් සමඟ ප්‍රශ්න ඇතිකර නොගත් යහපත් දරුවෙකි. දිනක් පන්තිකාමරයේ යම් කටයුත්තක නිරතවෙමින් සිටින විට ඔහුට අසන්නට ලැබුන පුවතින් කරකියා ගත නොහැකි අසරණ තත්ත්වයක පත් විය. ඔහුට අසන්නට ලැබුණු පුවත වන්නේ, ඉතා ඉක්මනින් විදුහල්පති කාමරයට පැමිණෙන ලෙසය. එතැන් සිට .......

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **දෙවන වාර පරීක්ෂණය 2025**

**10 ශ්‍රේණිය** **නාට්‍ය හා රංගකලාව**

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(3) | 3 -(4) | 4 -(2) | 5 -(1) | 6 -(1) | 7 -(4) | 8 -(2) | 9 -(3) | 10 -(3) |
| 11-(1) | 12 -(3) | 13 -(1) | 14 -(4) | 15 -(3) | 16 -(1) | 17 -(42) | 18 -(2) | 19 -(2) | 20 -(3) |
| 21-(4) | 22 -(13) | 23 -(3) | 24 -(2) | 25 -(3) | 26 -(3) | 27 -(2) | 28 -(2) | 29 -(3) | 30 -(2) |
| 31-(1) | 32 -(1) | 33 -(2) | 34 -(4) | 35 -(3) | 36 -(2) | 37 -(4) | 38 -(1) | 39 -(4) | 40 -(4) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

**II කොටස**

01. (i) උම්මග්ග ජාතකය
(ii) රංග ශෛලිය - නාට්‍ය ධර්මී
රංග සම්ප්‍රදාය - නාඩගම්
(iii) දික්තලා , කාලගෝල දික්පිටියා, මහෞෂධ, චතතුදත්ත
(iv) එහි කුමන හෝ ගීතයක කොටසක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
(v) 1975
(vi) පුණ්‍යසේන ගුණසිංහ

02. (i) කිසිදු අදහසක් ප්‍රකාශ නොකෙරෙන හුදු රිද්මයානුකූල තාලානුකූල නර්තන කොටස් ය. උදාඃ- ලී කෙළි, කළ ගෙඩි, උඩරට වන්නම්, උඩරට නර්තන කොටස් ආදිය වේ.
(ii) නෘත්ත හා නෘත්‍ය සමාන තා
චලන භාවිතා කිරීම
තාලානුකූල හා රිද්මයානුකූල බව
නර්තනය ප්‍රධාන වීම
ආංගික අභිනය භාවිතය
ශාරීරික භාෂාවක් වීම ආදී වශයෙන් කරුණු ලියා ඇත්නම් ලකුණු දෙන්න.
නෘත්ත හා නෘත්‍යයේ වෙනස්කම්
නෘත්‍යවල ආංගික අභිනය භාවිතා කිරීම
නෘත්‍යවල ආංගික හා තාත්වික අභිනය භාවිතය
නෘත්‍යවල කිසිදු අදහසක් ප්‍රකාශ නොවේ.
නෘත්‍ය යම් අදහසක් හෝ භාවයක් ප්‍රකාශ වීම.
ආදී පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.
(iii) නෘත්ත හා නෘත්‍යවල අභින අඩු වශයෙන් භාවිතා වුවද නාට්‍යවල සතර අභිනයට භාවිතා කරයි. නෘත නෘත්‍යවල නර්තන කොටස් දක්නට ලැබෙන අතර නාට්‍යයේ චලන රිද්මයානුකූල / තාලානුකූලව චරිතයට ගැලපීම, නාට්‍යයේ චලන මාධ්‍යයනට වඩා සංවාද ප්‍රබල වීම, නාට්‍ය තුල නෘත්ත හා නෘත්‍යවල භාවිතාව ඇති බව. ..... ආදී වශයෙන් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න.

03. (i) ගායනය, රංගනය, චලනය පදනම් කරගෙන ශිල්පියාගේ සිරුර භාවිතා කරමින් රංග භූමියක් මත තම පෞරුෂය මැනවින් ප්‍රකට කරමින් සජීව ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ සජීවීව ඉදිරිපත් කරන නිරූපණ කලාව ප්‍රාසාංගික කලාව වේ.
(ii) නර්තනය, සංගීතය, නාට්‍ය, මුද්‍රා නාට්‍ය, බැලේ, ඔපෙරා, ගීත නාට්‍ය ආදීවශයෙන්
(iii) ප්‍රාසාංගික කලා සජීව වේ.
ඉදිරිපත් කරන්නා හා නරඹන්නා සජීව වේ
රංග භූමියක ඉදිරිපත් කරයි.
ප්‍රේක්ෂක පිරිසක් සිටියි.
ප්‍රේක්ෂක ප්‍රචාර ලැබේ.
ප්‍රේක්ෂකයා අභිමුඛව ඉදිරිපත් කරයි.
ප්‍රාසාංගික නොවන කලා ''සජීවී'' නොවේ.
1. ප්‍රේක්ෂකයා සජීව වුවද ඉදිරිපත් කරන්නා සජීවී නොවේ.
2. තිරයක් මතින් නිර්මාණයේ රස විදිය හැක.
3. කැමරාකරුගේ ඇසට ගෝචර වන දේ ප්‍රේක්ෂකයා රස විදියි.
4. ප්‍රේක්ෂක ප්‍රතිචාර විදගැනීමට ඉදිරිපත් කරන්නාට අවස්ථා නොලැබේ.
5. ප්‍රේක්ෂකයා හා සම්බන්ධතාවයක් නැත.

04. (i) යම් අවස්ථාවක් හෝ සිදුවීමක් දෙන ලද ඉඟියකට අනුව නිශ්චිත කාලසීමාවක් තුළදී, පිටපතක් නොමැතිව සූදානම් වීමකින් තොරව රඟදැක්වීමයි. (මේ හා සමාන පිළිතුරක් ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 02)

(ii) පරිකල්පන ශක්තිය දියුණු වේ.
ක්ෂණිකව ක්‍රියාත්මක වීමට හැකියාව ලබයි.
සාමූහිකත්වය වර්ධනය වේ.
අභිනය භාවිතයට හුරු වෙයි. (ලකුණු 04)

(iii) පන්ති කාමරයේ සිදු කර ඇති රංග ක්‍රීඩාවක් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

05. (i) රට යකුම/ සන්නි යකුම / සූනියම් යාගය (ලකුණු 02)

(ii) පහතරට ශාන්තිකර්මයට උපත් කතාවක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)

(iii)

| රට යකුම | සන්නි යකුම | සූනියම් යාගය |
|---|---|---|
| නානු මුරය | රූමත් ළදක් | වඩිග පටුන |
| කපුයක්කාරිය | ගැබිණි කතක් | |
| දරු නැලවිල්ල | දරුවෙක් ඇති මවක් | |
| | පාලි දොළහ | |
| | සන්නි 18 පැමිණීම | |

ඉහත නාට්‍යමය පෙළපාලියක් නම් කර එහි ප්‍රාසාංගික ලක්ෂණ විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

06. (i) රූපණය යනු චරිතයකට ආරෝපණය වී කිසියම් කාලසීමාවක් තුළ ජීවත් වීමේ නළු කාර්යයි. (ලකුණු 02)

(ii)

| <u>ගුණාංග</u> | <u>ශාක්‍යතා</u> |
|---|---|
| වෙහෙසීම | සතතාභ්‍යාසය |
| අමාරුකම් ගනක් නොගැනීම | රංග අභ්‍යාස වල නිරත වීම |

ආදී නිවැරදි පිළිතුරු වෙන්වෙන්ව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 04)

(iii) රූපණයේදී සතර අභිනය භාවිතය විශේෂ වන ආකාරය සතර අභිනය නම් කරමින් රූපණ කාරයට දායක කරගන්නා ආකාරය පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ලකුණු 06)

07. (i) සංවාද රංග විධාන චරිත සහිත පිටපත් රචනය සඳහා 4/4
(ii) ගැටුම් අවස්ථා නිර්මාණය සඳහා 4/4
(iii) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා 4/4

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **නාට්‍ය හා රංගකලාව**

## ප්‍රායෝගික පරීක්ෂණය

### ඇගයීම් 01

පෙළ ආශ්‍රිත භාෂණ රංගනය (කේවල)

(i) නාට්‍ය ධර්මී ලෝක ධර්මී සංවාද බන්ධයක් ඉදිරිපත් කිරීම - නිර්දිෂ්ඨ ග්‍රන්ථවලින් (දික්තල කාලගෝල / විකෘති)

(ii) සිසුවා ඉදිරිපත් කරන ලද සංවාද බන්ධය සැලකිල්ලට ගෙන අනිර්දිෂ්ඨ නාට්‍යයෙන් සංවාද කොටසක් ලබා ගැනීම. (තලමල පිපිලා / මනමේ) (ලකුණු 20)

### ඇගයීම් 02

දෙන ලද මාතෘකා අනුව ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කරන්න. (ගුරුවරයාට අභිමත පරිදි දී ඇති මාතෘකාවේ අගට සුදුසු නාට්‍යමය අවස්ථාවක් නිර්මාණය කරන්න.)

- දික්පිටියා සමග දික්තලා ගෙදර යන විට ....
- මිදුලේ සෙල්ලම් කරමින් සිටි ඇය/ඔහු සමනලුන් පසුපස යමින් කැලයේ අතරමං වූ විට ....
- ළමා දිනයේ දී ඇයට / ඔහුට නාඳුනන පුද්ගලයෙකුගෙන් ලැබුණු තෑග්ග ....
- වැසි දිනයක දී තමාගේ කුඩය අමත වී .....
- දිව්‍ය ලෝකයට යෑම සඳහා ටිකට් එකක් ලැබුණ විට දී .... (ලකුණු 15)

### ඇගයීම් 03

සිසුන් කැමති ආකාරයට සාමූහික නාට්‍යයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 15)

### ඇගයීම් 04

නාට්‍ය ගීතයක් ගායනය, රංගනය සහිතව ඉදිරිපත් කරන්න. (ලකුණු 15)

### ඇගයීම් 05

අ.පො.ස. (සා.පෙළ) විභාගයට නිර්දිෂ්ඨ සංගීත බන්ධවලින් කැමති එකක් තෝරාගෙන සාමූහික රංග රචනයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 15)

### ඇගයීම් 06

කතන්දරයක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කරන්න. (ලකුණු 20)